චක්‍රලේඛ අංක:- 12/2005

මගේ අංකය:-බප/සසේකො/ලේ/තිජ්
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක: 50, කිතුල්වත්ත පාර,
කොළඹ - 08.
2005.09.22

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර
සමිති සභාපතිවරුන් වෙත.

මහත්මයාණනි,

ඉන්ධන පිරවුම්හල් වල පොම්පකරුවන් සඳහා
දිරි දීමනාවක් ගෙවීම

විවිධ සේවා සමුපකාර සමිති විසින් පවත්වාගෙන යනු ලබන ඉන්ධන පිරවුම්හලක මාසික ලාභය රු. 75000/- ඉක්මවන්නේ නම් පහත සඳහන් කොන්දේසි යටතේ පොම්පකරුවන් සඳහා මාසික දිරි දීමනාවක් ගෙවීමට කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

(1). මාසිකව අවම වශයෙන් දින 22 ක් සේවයට වාර්තා කර තිබිය යුතු අතර, එක් දිනක් තුළ අවම වශයෙන් පැය 08 ක් සේවය කර තිබීම මත රු.500/- ක පැමිණීමේ දිරි දීමනාවක් සහ

(2). ඉහත සඳහන් සේවා කාල නියමයන් පදනම් කොට ගෙන මාසික ලාභය රු.75000/- ඉක්මවන විට තවත් රු.500/- ක දිරි දීමනාවක් ගෙවීම.

(3). අර්ධ සේවා මුර මේ දීමනා සඳහා ගණන් නොගත යුතුය.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. පෞද්ගලික ලේකම්, පළාත් මාර්ග, සමුපකාර ගරු අමාත්‍ය (බ.ප.)
3. ලේකම්, පළාත් මාර්ග, සමුපකාර අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති

12/2005

මගේ අංකය :- බප/සසේක/ඉල්/නිදි
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2005.10.05

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් බැංකු සංගම් හා සමුපකාර ණය දෙන සමිති වල
සභාපති වරුන් වෙත.

මහත්මයාණෙනි,

**අයවැයෙන් වැඩිකල රු. 2500/- දීමනාවක් වශයෙන් සමුපකාර සේවකයින්ටද ලබා දීම.**

2005.10.05 දින බ.ප. පලාත් පාලන හා සමුපකාර අමාත්‍යාංශයේදී ගරු ඇමතිතුමාගේද ප්‍රධානත්වයෙන් සහ සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා හා සහකාර කොමසාරිස්වරුන්ගේද සහභාගීත්වයෙන් පැවති සාකච්ඡාවේදී තීරණය වූ පරිදි සමුපකාර සේවකයින් සඳහා ඉහත සඳහන් දීමනාව ගෙවීමේදී ඒ ඒ සමිති විසින් එකී සමිතිවලට අදාළ පරිදි යෝජනා සකස් කොට සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට සහභාගී වූ සියළුම සමිතිවල සභාපතිවරුන්ගේ සහ නියෝජිතයින්ගේ එකඟතාවය අනුව තීරණය විය.

02. එසේම ආර්ථික වශයෙන් ශක්තිමත් සමිති සඳහා මුල් අදියර වශයෙන් මේ මස පළමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 1000/- ක දීමනාවක් ගෙවීමට ක්‍රියා කල හැකි බව සමුපකාර කොමසාරිස්තුමාගේද එකඟතාවය මත තීරණය විය.

03. ඉහත පළමු ඡේදයේ සඳහන් යෝජනා මාලාව ඒ ඒ දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන්ගේ මාර්ගයෙන් 2005.10.15 දිනට පෙර ලැබීමට සලස්වන්නේ නම් වඩාත් උචිත බවටද තීරණය විය.

04. එබැවින් ඉහත 1 ඡේදයේ සඳහන් යෝජනාවලිය ඒ ඒ දිස්ත්‍රික්ක වල සමුපකාර සහකාර කොමසාරිස්වරුන් මාර්ගයෙන් කොමිෂන් සභාව වෙත ලැබීමට ක්‍රියා කරන ලෙස දැනුම් දෙන අතර, එකී යෝජනා සලකා බැලීමෙන් පසු ඒ ඒ සමිති සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේද එකඟතාවය පරිදි ඒ ඒ සමිති වෙත දැනුම් දෙනු ලැබේ.

05. මෙම ගෙවීම හේතු කොට ගෙන සමිතියේ ලාභය හෝ අලාභය කෙරෙහි ඇතිවන බලපෑම ප්‍රතිශතයක් වශයෙන් දැක්වීමද ඔබගේ යෝජනාවලියට ඇතුලත් විය යුතුය.

06. මෙම ගෙවීම 2005.10.01 දින සිට අනුගමනය කල යුතු බවද එම සාකච්ඡාවේදී තීරණය වූ අතර, ඔබේ යෝජනා පිළිබඳ සලකා බලා තීරණයක් ලබා ගැනීම කිසියම් ආකාරයකින් ප්‍රමාද වුවත් එකී නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීම් අනුමත කිරීමට කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

අධ්‍යක්ෂක මණ්ඩලයේ [illegible]

මෙයට විශ්වාසී,
ආර්.එන්. පෙරේරා,

පිටපත් :- 1. බස්නාහිර පළාත් පළාත්මාර්ග හා සමුපකාර අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ නිලධාරී

2. ප්‍රධාන ලේකම් (බ.ප.)

3. ලේකම්, පළාත්මාර්ග හා සමුපකාර අමාත්‍යාංශය (බ.ප.)

4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (බ.ප.)

5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ( කොළඹ, කළුතර, ගම්පහ)
   - මේ සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ සහිත යෝජනා මා වෙත ඉදිරිපත් කරන්න.